5338


# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මුරුතවෙල

வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – முறதவெல

**Resident Project Management Office – Muruthawela**

**වාරිමාර්ග කළමනාකරණ අංශය**

நீர்ப்பாசன முகமைத்துவ பிரிவு

**Irrigation Management Division**

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு

**Ministry of Irrigation & Water Resources Management**

වීරකැටිය
வறகாட்ய
Weraketiya.



23 NOV 2017
වාරිමාර්ග කළමනාකරණ අංශය


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No } 23/3/28 | ඔබේ අංකය / உமது இல. / Your Ref No } | දිනය / திகதி / Date } 2017.07. |

<u>ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම ජූලි මාසය</u>

<u>මුරුතවෙල ව්‍යාපාරය</u>

දිනය - 2017.07.04

ස්ථානය - මුරුතවෙල නේවාසික ව්‍යාපෘති කලමනාකරණ කාර්යාලය

වේලාව - පෙ.ව. 9.30

<u>සහභාගිත්වය</u>

<u>රාජ්‍ය නිලධාරීන්</u>

01. කේ.එච්.එන්.එස්.කුමාර මහතා - වාරිමාර්ග ඉංජිනේරු - වීරකැටිය
02. කේ.ජයසිංහ මහතා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
03. ඩබ්ලිව්.ජී.ඒ.එන්. ලක්මාලි මිය - සංවර්ධන නිළධාරි- මුරුතවෙල ව්‍යාපාරය
04. ජේ.එස්.ඩෙල්කානි මිය - සංවර්ධන නිළධාරි- මුරුතවෙල ව්‍යාපාරය
05. ඊ.ඒ.ඒ සංජීවනි මිය - සංවර්ධන නිළධාරි - මුරුතවෙල ව්‍යාපාරය
06. එල්.එස්. හෙට්ටිආරච්චි මයා - සංවර්ධන නිළධාරී - වාරි.කා.වීරකැටිය
07. කේ.ටී. බන්දුසිරි මහතා - ඉංජිනේරු සහකාර - වාරි.කා.වීරකැටිය
08. ආර්.පී.සී.කුලරත්න මිය - ඉංජිනේරු සහකාර - වාරි.කා.වීරකැටිය
09. ඒ.බී.එම්.රංජිත් විජේසුන්දර මයා - තාක්ෂණ සහායක - වාරි.කා. වීරකැටිය
10. පී.වී. ඉන්දික මයා - කෘෂිකර්ම උපදේශක - උඩයාල
11. ජේ.එච්.ජේ. ප්‍රසන්න මයා - කෘෂිකර්ම උපදේශක - මැදමුලන
12. කේ.ඩී. සුනිල් මයා - කෘ.ප.නි. ස. - දහඅමුණ

<u>ගොවි සංවිධාන නියෝජිත මහතුන්</u>

1. ඒ.එම්.කේ. ගුණසේන මයා - යාය 01 වීර 01 සභාපති
2. කේ.කේ. ලක්ෂිත කොඩිකාර මයා - යාය 01 රුහුණු සභාපති
3. විජේරත්න කළුආරච්චි මයා - යාය01 උළුකපුහේන භාණ්ඩාගාරික
4. ජයසේන විදානපතිරණ මයා - යාය 01 වීර 02 ලේකම්
5. එස්.අලහප්පෙරුම මයා - යාය 01 සියඔපහැද්දෑව ලේකම්
6. පියදාස විජේසිංහ මයා - යාය 01 සියඔලහැද්දෑව සභාපති
7. ජිනදාස මොහොට්ටි මයා - යාය 02 ඩී 02/03 භාණ්ඩාගාරික

8. ඕ.ඒ. පියසේන මයා - යාය 02 ඩී 04 සභාපති
9. ටී. ජයතිස්ස මයා - යාය 02 ඩී 05 සභාපති
10. ආර්.කේ. වීරපාල මයා - යාය 02 ඩී 06 සභාපති
11. එම්.ඒ. කුමාරසිරි මයා - යාය 02 ඩී 06 ලේකම්
12. ජී. සයිමන් මයා - යාය 02 ඩී 07 සභාපති
13. කේ. අමරසේන මයා - යාය 02 ඩී 07 ලේකම්
14. ඩබ්ලිව්.ඒ. චන්ද්‍රසිරි මයා - යාය 03 ඩී 01 සභාපති
15. කේ.කේ. ඇඩ්වින් මයා - යාය 03 ඩී 02 සභාපති
16. ඩබ්ලිව්.එම්.ආරියදාස මයා - යාය 03 ඩී 02 ලේකම්
17. උපසේන අමරවීර මයා - යාය 03 ඩී 04 භාණ්ඩාගාරික
18. වී.ජී. විජේදාස මයා - යාය 03 ඩී 04 සභාපති
19. ආර්.ඒ. ජිනදාස මයා - යාය 02 ඩී 04 ලේකම්
20. ඒ. සුජිත් මයා - යාය 03 ඩී 06 සභාපති
21. ජී.ඒ. ගුණපාල මයා - යාය 03 ඩී 07 ලේකම්
22. ඩබ්ලිව්. පී. අමරසේන මයා - යාය 03 ඩී 08 සභාපති
23. ඩබ්ලිව්.එල්.වීරසිංහ මයා - යාය 03 ඩී 08 ලේකම්
24. ටී.කේ. ආරියදාස මයා - යාය 03 ඩී 08 භාණ්ඩාගාරික
25. ජී.ජී. ප්‍රේමතිලක මයා - යාය 03 ඩී 09 සභාපති

න්‍යාය පත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව නෝ.ව්‍යා.කළ. විසින් පැමිණ සිටි පිරිස පිලිගන්නා ලදී. අනතුරුව පසුගිය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි.පසුගිය වාර්ථාව සමාලෝචනය කරමින් යාය 03 ඩී 09 ලේකම් යන්න යාය 02 ඩී 09 ලේකම් ලෙස වෙනස්විය යුතු බව පැවසීය.

<u>ආයතන සංවර්ධන කටයුතු</u>

➢ <u>නිලවරණ පැවැත්වීම</u>

| ගොවි සංවිධානයේ නම | නිලවරණ මහා සභාව පැවැත්වූ දිනය |
|---|---|
| යාය 02 ඩී 5 | 2017.06.13 |
| යාය 01 වීර 1 | 2017.06.14 |
| යාය 03 ඩී 7 | 2017.06.15 |
| යාය 03 ඩී 8 | 2017.06.19 |
| යාය 02 ඩී 1 පහළ | 2017.06.22 |
| යාය 01 සියඹලහැද්දැව එක්සත් | 2017.06.27 |
| යාය 01 ප්‍රගති | 2017.06.29 |

මෙම වසරට පැවැත්වීමට නියමිත නිලවරණ මහා සභා රැස්වීම් පවත්වා අවසන් කර ඇත.

➢ <u>ගොවි සංවිධාන මහා සභා රැස්වීම් පැවැත්වීම</u>

| ගොවි සංවිධානයේ නම | මහා සභා රැස්වීම් පැවැත් වූ දිනය |
|---|---|
| යාය 01 උළුකපුහේන | 2017.06.19 |
| යාය 01 රුහුණු | 2017.06.22 |
| යාය 01 පියකරු | 2017.06.23 |
| යාය 01 වීර 2 | 2017.06.23 |
| යාය 02 ඩී 4 | 2017.06.09 |
| යාය 02 ඩී 6 | 2017.06.13 |
| යාය 02 ඩී 7 | 2017.06.14 |

| | |
|---|---|
| යාය 02 ඩී 8 | 2017.06.12 |
| යාය 02 ඩී 9 | 2017.06.21 |
| යාය 03 ඩී 1 ගැමුණු | 2017.06.15 |
| යාය 03 ඩී 2 ගැමුණු | 2017.06.28 |
| යාය 03 ඩී 3 ගජබා | 2017.06.30 |
| යාය 03 ඩී 4 විජය | 2017.07.03 |
| යාය 03 ඩී 9 | 2017.06.20 |

➢ <u>පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>

මූලා කළමනාකරණ පුහුණු වැඩසටහන් 03 ක් පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවත් වපුරා අවසන් වූ විගස එම පුහුණු වැඩසටහන් යාය 01, යාය 02 සහ යාය 03 කොටස් සඳහා පවත්වන බවත් පැවසීය.
ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරු වැඩසටහන යටතේ දින 03 චාරිකාවක් යාමට සැලසුම් කර ඇති බවත් කල්පිටිය ප්‍රදේශයේ වගාව නැරඹීමට ද බලාපොරොත්තුවන බවත් පැවසීය.ගොවි සංවිධාන මගින් ලිපි නිකුත් කිරීමේදී තම සාමාජිකයන්ට පමණක් වගකීමෙන් ලිපි ලබාදීමට කටයුතු කරන ලෙස නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමා ගොවි නියෝජිතයින්ට උපදෙස් දෙන ලදී.

<u>වාරිමාර්ග කටයුතු - ( වාරිමාර්ග ඉංජිනේරු සහකාර - කේ.ටී. බන්දුසිරි මහතා )</u>

මුරුතවෙල ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 28800 බවත් වාරිමාර්ග ගැටළුවක් ලෙස ජලය බස්නාවෙන ප්‍රමාණය වැඩි බවත් පැවසීය. යාය 01 කොටසේ වගා බිම් වලින් 90% ක් වපුරා අවසන් බවත් ජල පාලනය සඳහා නිරන්තර මැදිහත් වීමක් කරන ලෙසත් ගවයින් ඇල මාර්ගයට දැමීම නිසා වාරිමාර්ග පද්ධතියට හානි සිදු වී ඇති බවත් පැවසීය.යාය 01 සඳහා ජලමුරය ලබාදීම ජූලි 01 දින සිට ආරම්භ කරන බවත් සතියකට දින 03ක් ජලය ලබාදීමට කටයුතු කරන බවත්, යාය 02 කොටසේ දොරවල් ජූලි 06 දින පෙ.ව. 6.00 වසන බවත් පැවසීය.
යාය 01 කොටසේ ඇලවල්වල දොරවල් සකස් කර ඉබි යතුරු දමා දෙන ලෙස සියඹලහැද්දැව ගොවි සංවිධානයේ ලේකම්වරයා ඉල්ලීය.ඒ සඳහා වැයවන මුදල යාය 01 ගොවි සංවිධානවලින් ලබාදීමටද එකග විය.
යාය 02 ඩී 06 ගොවි සංවිධානයේ ලේකම්වරයා Crip ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිසා FC 68, FC 69 ඇලවල්වල අක්කර 35 වගා කිරීමට ජලය ලබාගත නොහැකි වී ඇති බව පැවසීය.
ඉංජිනේරු සහකාර බන්දුසිරි මහතා පවසා සිටියේ මෙම කාරණය ලිඛිතව වාරිමාර්ග කාර්යාලයට ලබාදෙන ලෙස උපදෙස් දී ඇතත් තවමත් ලිඛිත දැනුම් දීමක් ලබාදී නොමැති බවයි.තවද ඇලවේලි සුද්ද කිරීමේ ප්‍රමාදයක් ඇති බවත් ඉක්මනින් ඇලවේලි සුද්ද කර ගන්නා ලෙසත් පැවසීය.

<u>ජලමුර ලබාදීමේ කාලසටහන</u>

යාය 03 FC 66 සිට ඩී 09 දක්වා - ජූලි 6 සිට ජූලි 21 දක්වා ( දින 15න් වගාකර අවසන් කල යුතුයි.)
යාය 03 ඩී 01 සිට FC 66 දක්වා - ජූලි 18 දින මුර ජලය ලබාදීම (සතියකට දින 03ක් )
යාය 03 FC 66 සිට ඩී 09 දක්වා - ජූලි 21 දින මුර ජලය ලබාදීම (සතියකට දින 03ක් )

යාය 03 ඩී 09 සභාපතිවරයා යාය 03 කොටසේ නඩත්තු කටයුතු සඳහා JCB යන්ත්‍රය දින කිහිපයකට ලබාදෙන ලෙස ඉල්ලීය.
ඉංජිනේරු සහකාරවරයා JCB යන්ත්‍රය ලබාදීමට එකග විය.

කෘෂිකාර්මික කටයුතු - මූලස්ථාන කෘෂිකාර්මික උපදේශක අගුණකොලපැලැස්ස (අතුල රාජපක්ෂ මයා)

යල කන්නය පමා වී වගා කටයුතු සිදු කිරීම නිසා 2017/2018 මාස් කන්නයට බලපෑමක් ඇතිවිය හැකි බැවින් ඉක්මනින් යල කන්නයේ වැඩ අවසන් කරන ලෙස පැවසීය. මුරුතවෙල ව්‍යාපාරයේ ගොවීන්ට බිත්තර වී නොමිලේ ලබාදීමට හැකි වූ බවත් දෙමුහුන් බඩ ඉරිගු 50% සහනාධාර ලෙස ලබාදීමට හැකියාව ඇති බවත් පැවසීය.

කෘෂිකර්ම උපදේශක (උඩයාල ) - පී.වී. ඉන්දික මයා

එලවලු සහ පලතුරු වගාවල පලතුරු මැස්සන්ගෙන් වන හානිය වලක්වා ගැනීම සඳහා පෙර මෝහ උගුල් නොමිලේ ලබාදෙන බවත් අදාල ඉල්ලීම් බදාදා දිනක කාර්යාලයට පැමින ලබාදෙන ලෙසත් ඉල්ලීය.අත්තනයාල කලාපයේ කිරි අල වගා කිරීමට කැමැති ගොවි මහතුන් 04 දෙනෙකුට අවස්ථාව ලබාදිය හැකි බවත් තවදුරටත් පැවසීය.

විශේෂ කටයුතු - කිරිදිඹය ව්‍යාපාරයෙන් සහල් පරිත්‍යාග කිරීම.

කන්න ගණනාවක් නියගයෙන් පීඩා විදි මුරුතවෙල ව්‍යාපාරයේ ගොවීන්ට සහනයක් වශයෙන් කිරිදිඹය ව්‍යාපාරයේ ගොවි මහතුන් විසින් ගොවි සංවිධාන වලින් එකතු කරගත් සහල් කිලෝ 5 බෑග් 500ක් කිරිදිඹය නේවාසික ව්‍යාපෘති කලමනාකාර මහතා සහ ගොවි නියෝජිතයින් විසින් පරිත්‍යාග කිරීම සිදුවිය.

මෙම කටයුත්ත පිලිබඳව අදහස් දක්වමින් මුරුතවෙල ව්‍යාපාරයේ නේවාසික ව්‍යාපෘති කලමනාකාර මහතා පවසා සිටියේ අධික නියගය පැවැති කාලයක විශාල කැපකිරීමක් සිදු කර ලබාගත් අස්වැන්නෙන් කොටසක් මුරුතවෙල ව්‍යාපාරයේ ගෙවීන්ට පරිත්‍යාග කිරීම මහගු කාර්යක් බවයි.

ව්‍යාපාර කමිටු ලේකම්වරයාගේ ස්තුති කථාවෙන් පසුව සභාවේ වැඩ කටයුතු නිම විය.

.........................................
කේ.ජයසිංහ,
නේවාසික ව්‍යාපෘති කළමනාකාර,
මුරුතවෙල මහා වාරිමාර්ග ව්‍යාපාරය.

කේ. ජයසිංහ
නේවාසික ව්‍යාපෘති කලමණාකරු
වාරිමාර්ග කලමණාකරණ අංශය
මුරුතවෙල ව්‍යාපාරය
මොරයාය, වැකඳවල,
වීරකැටිය.

..............
ටී.ජයතිස්ස,
ලේකම්.

පිටපත්
අධ්‍යක්ෂ/ වාරිමාර්ග කලමනාකරණ අංශය - කා.දැ.ස.